SRI LANKA



SAKYA
No. 08, Pieterz Place, Kohuwala, Nugegoda.
Tel: 011 281 4908, 0777 583268
Fax: 011 281 0896
Web: www.sakya.edu.lk

# ආර්ථික විද්‍යාව
# ECONOMICS
## (ECN)
## (103)

## T- 01

# සැපයුම් ප්‍රමාණය වෙනස් වීම සහ සැපයුම වෙනස් වීම

## සැපයුම් ප්‍රමාණය වෙනස්වීම

**සලකා බලන භාණ්ඩයේ මිල හැර අනුසාධක ස්ථාවර වව තිබියදී භාණ්ඩයේ මිල අඩු හෝ වැඩි වීමට ප්‍රතිචාර ලෙස එහි සැපයුම ප්‍රමාණය අඩු හෝ වැඩි වීම මින් අදහස් වේ. මෙහිදී සැපයුමම් වක්‍ර එහි කිසිදු වෙනසක් සිදු නොවන අතර වක්‍ර දිගේ ලක්ෂ ඉහළට හෝ පහලට ගමන් කිරීමක් පමණක් සිදු වේ .**

**ඒ අනුව මෙය සිදුවිය හැකි ආකාර දෙකකි**

**1 සැපයුම් ප්‍රමාණය අඩුවීම ( සැපයුම් සංකෝචනය )**

අනෙක් කරුණු නොවෙනස්ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල අඩු වුවහොත් සැපයුම් ප්‍රමාණය අඩු වන අතර එහි බලපෑම නිසා සැපයුම් වක්‍රය මත පිහිටි ලක්ෂය වක්‍රය දිගේ පහළට ගමන් කිරීම මින් අදහස් වේ.

**2 සැපයුම් ප්‍රමාණය වැඩිවීම ( සැපයුම් ප්‍රසාරණය )**

අනෙක් කරුණු නොවෙනස්ව තිබියදී සලකා බලන භාණ්ඩයේ මිල වැඩි වුවහොත් සැපයුම් ප්‍රමාණය වැඩි වන අතර එහි බලපෑම නිසා සැපයුම් වක්‍රය මත පිහිටි ලක්ෂය වක්‍රය දිගේ ඉහලට ගමන් කිරීම මින් අදහස් වේ.



# සැපයුම් වෙනස් වීම

**සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවරව තිබියදී අනෙකුත් සාධක වෙනස් වීම් මත පෙර මිල ගණන් යටතේ ම පෙරට වඩා වෙනස් ප්‍රමාණයක් සැපයුම් කිරීම් මින් අද අදහස් වේ. මෙහිදී සැපයුම් වක්‍රය මුළුමනින්ම වමට හෝ දකුණට විතැන් වේ.**

**මෙය සිදුවිය හැකි ආකාර දෙකකි.**

**1 සැපයුම අඩුවීම**

සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවරව තිබියදී අන්සාධක වෙනස් වීම මත පෙර මිල ගණන් යටතේ ම පෙරට වඩා අඩුවෙන් සැපයුම් කිරීම මින් අදහස් වේ. මෙහිදී සැපයුම් වක්‍රය වමට විතැන් වේ.

**2 සැපයුම් වැඩි වීම**

සලකා බලන භාණ්ඩයේ මිල ස්ථාවරව තිබියදී අන්සාධක වෙනස් වීම මත පෙර මිල ගණන් යටතේ ම පෙරට වඩා වැඩියෙන් සැපයුම් කිරීම මින් අදහස් වේ මෙහිදී සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ.



## සැපයුම් වක්‍රය දකුණට විතැන් වීමට හේතු

- සම්බන්ධිත භාණ්ඩ (නිෂ්පාදන ආදේශක) මිල පහළ යෑම
- නිෂ්පාදනයට යොදා ගන්නා යෙදවුම් මිල ගණන් පහළ යෑම
- තාක්ෂණික දියුණුව
- වෙළඳපොලේ සිටින සැපයුම්කරුවන් ප්‍රමාණයක් වැඩි වීම
- රජය නිෂ්පාදකයන්ගෙන් අයකරන බදු කපා හැරීම
- රජය නිෂ්පාදකයාට සහනාධාර ලබා දීම
- අනාගතයේද දී සලකා බලන භාණ්ඩයේ මිල අඩු වෙතැයි නිශ්පාදකයා අපේක්ෂා කිරීම

**ඉහත සාධක ප්‍රතිවිරුද්ධ ආකාරයටට වෙනස් වීම් මත සැපයුම් වක්‍රය වමට විතැන් වෙයි.**

**අභ්‍යාසය**

සැපයුම් වක්‍රය වමට විතැන් වීමට බලපාන සාධක නම් කරන්න.